# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,169 — 1960 ජූලි 29 වැනි සිකුරාද — 29.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයක් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 153 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 154 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | — |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරණ ලද ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 11 වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර, පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති ජූනියස් රිචර්ඩ් ජයවර්ධන වන මා විසින්—

(1) 1946යේ ඔක්තෝබර මස 4 වැනි දින අංක 9,609 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් සංශෝධිත 1940 හේ මාර්තු මස 29 වැනි දින අංක 8,597 දරණ ගැසට් පත්‍රයේ පළවූ, මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ඇතැම් ගම් මුලාදෑනි කොට්ඨාශවල ඡන්ද දායක කොට්ඨාශයන් නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ නිවේදනයට යාකොට ඇති උපලේඛනයේ කුඹුක්කඳන්වෙලට අදාල 4 වැනි කාරණය අස්කොට ඒ වෙනුවට, එහි සඳහන් විස්තර තොරතුරු සමහරක් පළමුවෙන් සඳහන් කරන්ට යෙදුණ උපලේඛනයේ නියමිත තීරුවල සඳහන් කරනු ලැබීමෙන්, මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් අළුත් කාරණය යෙදීමෙන් එය මෙයින් සංශෝධනය කර සිටිනු ලබන අතර,

(2) (1) වැනි ඡේදයේ විධිවිධාන, (අ) මාතලේ දිස්ත්‍රික්කයේ වගපනහ පල්ලේසියපත්තු ගම්ප්‍රදේශයේ ගම්කායසී සභාවට නියෝජිතයන් තෝරා පත්කරගනු ලැබීම පිළිබඳව 1961 වැනි අවුරුද්දේදී පැවැත්වීමට අදහස්කොට තිබෙන ඡන්ද විමසීම සම්බන්ධයෙන්වූ කිසියම් කාරණයකට පමණක් අදාළවන පරිදි, 1946යේ අංක 53 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් පිළිබඳ ආඥාපනතේ 82 වැනි වගන්තිය යටතේ ඉහතකී ගම්ප්‍රදේශය සම්බන්ධයෙන් සම්පාදිත නියෝගය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේදී ක්‍රියාත්මක වන බවද,

(ආ) වෙනත් කිසියම් කාරණයකට පමණක් අදාළවන පරිදි එහි සඳහන් දිනයේදී නිලයේ සිටින, ඉහතකී ගම්ප්‍රදේශයේ ගම්කායසී සභාවේ නියෝජිතයන්ගේ නිලකාලය අවසාන වන දින එක්කම ඊට පසු දිනයේදී ක්‍රියාත්මක වන බවද,

මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

ජේ. ආර්. ජයවර්ධන,
පළාත් පාලන සහ නිවාස කටයුතු
පිළිබඳ ඇමති.

1960 ජූලි මස 7 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

**වගපනහ පල්ලේසියපත්තු ගම්ප්‍රදේශය**

| 1 වැනි තීරුව | | 2 වැනි තීරුව |
|---|---|---|
| 4. කුඹුක්කඳන්වෙල | ... | කුඹුක්කඳන්වෙල ගමෙන් යුක්තවූ අංක 12 දරණ ඡන්දදායක කොට්ඨාශය.<br>ලේනව ගමෙන් යුක්තවූ අංක 13 දරණ ඡන්දදායක කොට්ඨාශය.<br>අලකොළවැව ගමෙන් යුක්තවූ අංක 13 "අ" දරණ ඡන්දදායක කොට්ඨාශය. |

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පිළිබඳ ආඥාපනත

1947තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරණ ලද 1946යේ අංක 53 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් පිළිබඳ ආඥා පනතේ 82 වැනි වගන්තිය යටතේ පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් සම්පාදිත නියෝගයයි.

ජේ. ආර්. ජයවර්ධන,
පළාත් පාලන සහ නිවාස කටයුතු
පිළිබඳ ඇමති.

1960 ජූලි මස 7 වැනි දින,
කොළඹ දීය.

### නියෝගය

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) II වැනි වගන්තිය යටතේ සම්පාදිතව, මෙම ගැසට් පත්‍රයේ පළකරණ ලද, වගපණිහ පල්ලේසිය පත්තු ගම්ප්‍රදේශයට අදාළ නිවේදනයේ (1) වැනි ඡේදයේ සඳහන් විධිවිධාන :—

(1) එකී විධිවිධාන ඉහතකී ගම්කායයී සභාවට නියෝජිතයන් තෝරා පත්කරගැනීම පිළිබඳව 1961 වැනි අවුරුද්දේදී පැවැත්වීමට අදහස්කොට තිබෙන ඡන්ද විමසීම සම්බන්ධයෙන්වූ කිසියම් කාරණයකට පමණක් අදාළවන පරිදි එකී විධිවිධාන, මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේදී ක්‍රියාත්මක වියයුතු අතරම ;

(2) එකී විධිවිධාන වෙනත් කිසියම් කාරණයකට පමණක් අදාළ වන පරිදි එහි සඳහන් දිනයේදී නිලයේ සිටින, ඉහතකී ගම්ප්‍රදේශයේ ගම්කායයී සභාවේ නියෝජිතයන්ගේ නිල කාලය අවසාන වන දිනය එක්කම ඊට පසු දිනයේදී ක්‍රියාත්මක විය යුතුද වන්නේය.

# අය-වැය ලේඛන

## මොරටුව නගර සභාව

### මුදල් නීති සංග්‍රහයේ අංක 12 (ii) යටතේ කරන ඉල්ලීමයි

අය-වැය ලේඛණය—1960

පහත දක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් ශීර්ෂවල මුදල් ඒ හා සමග දක්වෙන වැඩිපුර වියදම් යටතේ සඳහන් ශීර්ෂවලට මාරු කර ඉන් වැය කිරීම සඳහා නගර සභාව අනුමතිය ලබා ගන්නා ලදී.

ඉතිරි මුදල්
වැය ශීර්ෂ

| වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|
| ජේ—විදුලිබල දෙපාර්තමේන්තුව— | |
| (6) දිර්ඝකිරීම හා සංවර්ධනය කිරීම : | |
| (ඒ) උපකරණ ... ... | ... 3,000 0 |
| (8) ආපසු ගෙවීම ... ... | ... 1,000 0 |
| (3) සේවා හා නිවාසවලට කම්බි ඇදීම : | |
| (ඒ) උපකරණ ... ... | ... 5,000 0 |
| ඩී—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි— | |
| (7) නව කර්මාන්ත ... ... | ... 1,000 0 |
| බී—මහා මාර්ග— | |
| (3) යන්ත්‍ර හා ආයුධ ... ... | ... 15,000 0 |
| (8) සංවර්ධන කටයුතු ... | ... 5,000 0 |
| (12) නව කර්මාන්ත ... ... | ... 1,400 0 |
| ඊ—මහජන සනීපාරක්ෂාව— | |
| (7) වෙළඳපොළවල් හා ගාල් : | |
| (ඩී) ඉදිකිරීම ... ... | ... 800 0 |
| | 32,200 0 |

වැඩිපුර වියදම්
වැය ශීර්ෂ

| වැය ශීර්ෂ | රු. ශ. | |
|---|---|---|
| ජේ—විදුලිබල දෙපාර්තමේන්තුව— | | |
| (4) පාලන හා සාමාන්‍ය වියදම් : | | |
| (ඇෆ්) නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර ... | 1,000 0 | ...1960.7.9 දින |
| (ඩී) අනියම් ... ... | 2,000 0 | ... යෝජනා අංක 30 |
| (ඇෆ්) නිවාඩු දුම්රිය ප්‍රවේශපත්‍ර ... | 1,000 0 | ... එම |
| (3) සේවා හා නිවාසවලට කම්බි ඇදීම : | | |
| (ඊ) විදුලි මානක යන්ත්‍ර මිළයට ගැනීම ... | 5,000 0 | ... එම |
| ඩී—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි : | | |
| (4) නඩත්තු කිරීම ... | 1,000 0 | ... එම |
| බී—මහා මාර්ග— | | |
| (2) නඩත්තු කිරීම-ප්‍රතිසංස්කරණය ... | 15,000 0 | ... එම |
| (2) නඩත්තු කිරීම-ප්‍රතිසංස්කරණය ... | 5,000 0 | ... එම |
| (2) නඩත්තු කිරීම-ප්‍රතිසංස්කරණය ... | 1,400 0 | ... 1960.6.11දින යෝජනා අංක 20 |
| ඊ—මහජන සනීපාරක්ෂාව— | | |
| (7) වෙළඳපොළවල් හා ගාල් : | | |
| (ඩී) නඩත්තුකිරීම ... | 800 0 | ... 1960.7.9. දින යෝජනා අංක 32 |
| | 32,200 0 | |

1960 ජූලි මස 15 වැනි දින,
මොරටුව නගර සභා කාර්යාලයේදිය.

එච්. ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු
සභාපති.

## මොරටුව නගර සභාව

### අතිරේක අය-වැය ලේඛනය අංක 3—1960

| වැය ශීර්ෂ | රු. ශ. | |
|---|---|---|
| ජේ—විදුලිබල දෙපාර්තමේන්තුව— | | |
| 4. පාලන හා සාමාන්‍ය වියදම් : | | |
| (අයි) රජයේ විදුලිය දෙපාර්තමේන්තුවට ගාස්තු ... ... ... | 5,419 97 | ... යෝජනා අංක 25, 1960.6.11 දින |
| (ඩී) අනියම් ... ... ... ... ... | 245 01 | ... යෝජනා අංක 25, 1960.7.9 දින |
| | 5,664 98 | |

1960 ජූලි 15 වැනි දින,
මොරටුව නගර සභා කාර්යාලයේදිය.

එච්. ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු,
සභාපති.

## වැල්ලව ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් 1960 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන වැල්ලව ගම්කායයී සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දිනසිට දින 14 ක් ඇතුලත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1957තේ අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක. 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය සහ වෙලඳාම |
|---|---|
| ඒ. ඇම්. මොහම්මඩ් එලියාස් | මස්කඩය, අංක. 5/3, මල්ලව පිටිය, කුරුණෑගල. |

ඩී. බී. හේරත්,
වැල්ලව ගම්කායයී සභාවේ
සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
මරලුවාව, කුරුණෑගල.
1960, 7. 19.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.